සියලු ම හිමිකම් ඇවිරිණි

# ජාතික අධ්‍යාපන ආයතනය
## විභාග දෙපාර්තමේන්තුව

**PE 240**

## පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව
## II කොටස - 2012

## ඉගැන්වීමේ විශේෂ ක්‍රම සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

කාලය - පැය තුනයි.

සැලකිය යුතුයි

- ඔබට අදාළ ඉගැන්වීමේ විශේෂ ක්‍රම සහ තොරතුරු තාක්ෂණ විෂයයන්ට අදාළ ප්‍රශ්න පත්‍ර මෙහි අඩංගුය.
- ඒ අනුව ඔබට අදාළ ඉගැන්වීමේ විශේෂ ක්‍රම දෙක තෝරා ගෙන, එම විෂය දෙකෙන් එක් විෂයකින් ප්‍රශ්න දෙක බැගින් ප්‍රශ්න හතරකුත්, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය විෂය ප්‍රශ්න පත්‍රයෙන් තවත් එක් ප්‍රශ්නයක් ඇතුළු ව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- සෑම ප්‍රශ්නයකට ම සමාන ලකුණු හිමි වේ.
- ඔබේ විෂය පත්‍ර පටුනෙන් තෝරා ගන්න. ඒ ඒ විෂයයට පිළිතුරු වෙන වෙන ම ලියා පිළිතුරුපත් තුනක් ලෙස මුල් පිටු යොදා විභාග ශාලාධිපති වෙත භාර දෙන්න.

| විෂයය | | පිටු | විෂයය | | පිටු |
|---|---|---|---|---|---|
| ප්‍රාථමික අධ්‍යාපනය | (PE024A) | 2 | නර්තනය | (PE024N) | 09 |
| ගණිතය | (PE024B) | 3 | සංගීතය | (PE024P) | 10 |
| විද්‍යාව හා තාක්ෂණවේදය | (PE024C) | 4 | ජීවන නිපුණතා | (PE024Q) | 11 |
| වාණිජය (ව්‍යාපාර අධ්‍යයනය) | (PE024E) | 5 | Methodology of TESL | (PE024R) | 12 |
| සිංහල භාෂාව | (PE024F) | 6 | ඉතිහාසය | (PE024S) | 13 |
| බුද්ධ ධර්මය | (PE024H) | 7 | භූගෝල විද්‍යාව | (PE024T) | 14 |
| කිතුනු දහම | (PE024 K) | 7 | පුරවැසි අධ්‍යාපනය | (PE024U) | 15 |
| චිත්‍ර කලාව | (PE024M) | 8 | ICT | (PE024V) | 16 |

* * * * * * * * * * * *

FB Sri Lanka Teachers Services SLTS

# ඉගැන්වීමේ විශේෂ ක්‍රම

## ප්‍රාථමික අධ්‍යාපනය (PE024A)

(1) "ප්‍රාථමික අධ්‍යාපනයේ ගුණාත්මක භාවය ඉහළ නැංවීමෙහි ලා 1997 දී ප්‍රාථමික අධ්‍යාපනය හා සම්බන්ධ වෙනස්කම් කිහිපයක් යෝජනා කරන ලදී."

(i) ප්‍රාථමික අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ හඳුන්වා දෙන ලද ප්‍රධාන අවධීන් මොනවා ද? (ලකුණු 02)

(ii) "දරුවන් හඳුනා ගැනීමේ" වැඩ සටහන හඳුන්වා දීමේ අරමුණු තුනක් සඳහන් කර, එම වැඩ සටහන ක්‍රියාත්මක වීම සිදුවන ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04)

(iii) "එක් අවධියක් සඳහා එක් ගුරුවරයෙකු" යෝජනා කිරීමේ හේතු මොනවා ද යන්න ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iv) 2007 වර්ෂයේ සිට "ක්‍රියාකාරකම් පදනම් වාචික ඉංග්‍රීසි භාෂාව" පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයය සඳහා පමණක් නොව ගණිතය විෂයය සඳහා ද යෝජනා කර ඇත. මේ පිළිබඳ ඔබේ ඇගයීම උපදෙස් දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 08)

(2) "ප්‍රාථමික අධ්‍යාපන විෂයමාලාව එක් එක් අවධීන්වලට උචිත අන්දමින් සැලසුම්ගත ව ඉදිරිපත් කර ඇත."

(i) ප්‍රාථමික අධ්‍යාපන විෂයමාලාවේ හඳුන්වා දී ඇති ප්‍රධාන විෂයයන් මොනවා ද? (ලකුණු 02)

(ii) ප්‍රාථමික අධ්‍යාපනය සඳහා හඳුන්වා දී ඇති ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේද රූප සටහනක් ඇසුරින් පෙන්වා දෙන්න. (ලකුණු 04)

(iii) "පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්" විෂයට අදාළ ව පළමු හා දෙවන ශ්‍රේණි සිසුන් සහ තෙවන ශ්‍රේණි සිසුන් සමඟ අන්තර් ක්‍රියාකාරකම්වල නිරතවීමේ ඇති වාසි සහ අවාසි සහගත තත්ත්වයන් පිළිබඳ උදාහරණ දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iv) "සිසු ලැදියා සහ රුචිකත්ව" සඳහා වන වෛකල්පික විෂයයක් යනුවෙන් හඳුන්වන්නේ කුමක් දැයි පැහැදිලි කර, එය පන්තිකාමර මට්ටමින් ක්‍රියාත්මක වන ආකාර විස්තර කරන්න. (ලකුණු 08)

(3) "1943න් පසුව ප්‍රාථමික අධ්‍යාපනය මූලික අධ්‍යාපනයේ කොටසක් බවට පත් ව ඇත."

(i) 1967 වර්ෂය ප්‍රාථමික අධ්‍යාපනය සඳහා සුවිශේෂී වර්ෂයක් ලෙස හඳුන්වා දිය හැක්කේ කුමන හේතුවක් නිසා ද? (ලකුණු 02)

(ii) 1993-1997 දක්වා ක්‍රියාත්මක වූ විෂයයන් මොනවාදැයි සඳහන් කර, එය සමෝධානිත වූ ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(iii) 1974 ප්‍රාථමික අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ ඇති කරන ලද ප්‍රධාන වෙනස්කම් දෙකක් සඳහන් කර, ඒවා ප්‍රාථමික අධ්‍යාපනයේ ගුණාත්මක භාවය නැංවීම සඳහා කෙසේ බලපෑමක් වූයේ ද යන්න පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iv) 1997 ප්‍රාථමික අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ප්‍රාථමික අධ්‍යාපනය සම්බන්ධයෙන් මෙතෙක් සිදු වූ එමෙන් ම ප්‍රාථමික අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය කෙරෙහි සුවිශේෂ බලපෑමක් ඇති කළ ප්‍රතිසංස්කරණය යි. ඔබ මෙයට එකඟ වන්නේ ද නැද්ද යන්න හේතු සහිත ව කරුණු ඉදිරිපත් කරන්න. (ලකුණු 08)

(4) "ශ්‍රී ලංකාවේ ප්‍රාථමික අධ්‍යාපනයේ උන්නතිය උදෙසා 1985 දී පොදු අභිමතාර්ථ කිහිපයක් සහ එම අභිමතාර්ථ සාක්ෂාත් කර ගැනීමෙහි ලා 1993 දී අපේක්ෂිත නිපුණතා රැසක් ද හඳුන්වා දෙනු ලැබීය."

(i) 1985 ප්‍රාථමික අධ්‍යාපනය සඳහා හඳුන්වා දෙන ලද පොදු අභිමතාර්ථ දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) 1993 ක්‍රියාත්මක වූ ප්‍රාථමික අධ්‍යාපන පොදු අපේක්ෂිත නිපුණතා ඔබ ඉහත සඳහන් කළ පොදු අභිමතාර්ථ දෙක හා සම්බන්ධ වන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(iii) 1993 අපේක්ෂිත නිපුණතාවල අන්තර්ගත විශ්ලේෂණය කරමින් එමගින් ආවරණය වන විෂය ක්ෂේත්‍ර මොනවා දැයි සඳහන් කරන්න. (ලකුණු 06)

(iv) 1993 අපේක්ෂිත නිපුණතා සමග 2003 වර්ෂයේ අධ්‍යාපන කොමිෂන් සභා වාර්තා මගින් ඉදිරිපත් කළ මූලික නිපුණතා සමග සැසඳීමේ දී හඳුනා ගත හැකි සුවිශේෂතා විග්‍රහ කරන්න. (ලකුණු 08)

************

Sri Lanka Teachers Service

## ගණිතය (PE024B)

(1) (i) නිපුණතාව යන්නෙහි අදහස කෙටියෙන් ලියන්න. (ලකුණු 02)

(ii) නිපුණතා පාදක ප්‍රවේශයෙහි ඇති වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 04)

(iii) 8 ශ්‍රේණියේ ගණිත නිපුණතාවක් දක්වා, ඊට අදාළ නිපුණතා මට්ටම් ලියා දක්වන්න. (ලකුණු 06)

(iv) ඉහත ඔබ සඳහන් කළ නිපුණතා මට්ටමක් ළඟා කර ගැනීම සඳහා උචිත ක්‍රියාකාරකමක් ගොඩ නගන්න. (ලකුණු 08)

(2) (i) ගණිතය පොදු මානව අවශ්‍යතාවක් බව පෙන්වීමට උචිත උදාහරණයක් ඉදිරිපත් කරන්න. (ලකුණු 02)

(ii) ගණිතය පාසල් විෂයයක් ලෙස ඉගැන්වීමට කටයුතු යොදා ඇත්තේ ඇයිදැයි පැහැදිලි කරන්න. (ලකුණු 04)

(iii) ඉතිහාසය තුළ ගණිතයේ ක්‍රමික වර්ධනය හා පාසලේ ගණිතය ඉගැන්වීමේ අනුක්‍රමය අතර සම්බන්ධතාව පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iv) මානව සංවර්ධනය උදෙසා ගණිතය විෂයයෙහි දායකත්වය අගය කරන්න. (ලකුණු 08)

(3) (i) භාග සංකල්පය කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 02)

(ii) භාග සඳහා ඉගැන්වීමේ අනුක්‍රමයක් සකසන්න. (ලකුණු 04)

(iii) සංඛ්‍යා බෙදීම මෙන් නොව භාග බෙදීම වෙනස් ආකාරයකට උගන්වනු ලැබේ. ඊට පාදක වූ හේතු විස්තර කර කරුණු දක්වන්න. (ලකුණු 06)

(iv) භාග සංකල්පය ගොඩ නැගීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග ඉදිරිපත් කර පැහැදිලි කරන්න. (ලකුණු 08)

(4) (i) සංඛ්‍යාංකන පද්ධතියක් යනු කුමක් ද? (ලකුණු 02)

(ii) හින්දු අරාබි සංඛ්‍යාංකන පද්ධතිය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(iii) හින්දු අරාබි සංඛ්‍යාංකන ක්‍රමය හා ද්විමය සංඛ්‍යාංකන ක්‍රමය සසඳන්න. (ලකුණු 06)

(iv) ද්විමය සංඛ්‍යා එකතු කිරීම සඳහා යොදා ගත හැකි පැවරුමක් කට්ටලයකට උචිත ගැටලු යොමු කරන්න. (ලකුණු 08)

............

Sri Lanka Teachers Service - SLTS

## විද්‍යාව හා තාක්ෂණවේදය (PE024C)

(1) (i) නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ අනුව 6-11 පංති මට්ටමේ දී පාසල්වල විද්‍යාව විෂයය ඉගැන්වීමේ අරමුණු තුනක් දක්වන්න. (ලකුණු 02)

(ii) එම ශ්‍රේණිවල ඔබ උගන්වන ඒකකයක පාඩමක් උදාහරණයට ගෙන ඒ තුළින් ඉගෙන දී අරමුණුවලින් එකක් ඉටු වන අයුරු පැහැදිලි කරන්න. (ලකුණු 04)

(iii) විද්‍යාව ඉගැන්වීමේ දී යොදා ගන්නා විශේෂ ක්‍රමයක් නම් කර, එය තෝරා ගැනීමට හේතු සාධාරණීකරණය කරන්න. (ලකුණු 06)

(iv) විද්‍යාව ඉගෙන ගන්නා සිසුන් තුළ නිර්මාණශීලී බව ගොඩ නැංවීමට සුදුසු පංති ක්‍රියාකාරකමක් ඉදිරිපත් කරන්න. (ලකුණු 08)

(2) (i) "විද්‍යාව නූතන ලෝකයට අත්‍යවශ්‍ය විෂයයකි." මෙම කියමන සාධාරණීකරණයට කරුණු තුනක් දක්වන්න. (ලකුණු 02)

(ii) විද්‍යාව පාඩම් ඒකකයට අදාළ නිපුණතාව, නිපුණතා මට්ටම ඉදිරිපත් කර ඊට සුදුසු සිසු ක්‍රියාකාරකම් තුනක් කෙටියෙන් දක්වන්න. (ලකුණු 04)

(iii) "විද්‍යාත්මක ක්‍රමය" ට අදාළ පියවර මොනවා ද? ඔබ උගන්වන පාඩමක් උදාහරණයට ගෙන මෙය පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iv) "පරිසර සංරක්ෂණය කාලීන අවශ්‍යතාවකි" යන මැයෙන් පාසලේ විද්‍යා සංගමයේ බිත්ති පුවත්පතට සුදුසු ලිපියක් නිර්මාණය කරන්න. (ලකුණු 08)

(3) (i) විද්‍යාව යනු කුමක් ද? ඔබ හදාරා ඇති අයුරින් කෙටි නිර්වචනයක් දෙන්න. (ලකුණු 02)

(ii) "විද්‍යාත්මක සාක්ෂරතාවට" අදාළ කරුණු තුනක් සඳහන් කරන්න. ඔබගේ සිසුන් තුළ ඉන් එක් සාක්ෂරතාවක් වර්ධනය කිරීමට ඔබට ගත හැකි පියවර දක්වන්න. (ලකුණු 04)

(iii) විෂය සංකල්පයක් සඳහා "මග පෙන්වන ලද අනාවරණ ක්‍රමය" භාවිත කොට අවතල දර්පණයකින් ලැබෙන ප්‍රතිබිම්බවල ලක්ෂණ ඉගැන්වීමේ පාඩමක පියවර ලියන්න. (ලකුණු 06)

(iv) ඉහත පාඩම සඳහා යොදා ගන්නා ගුණාත්මක යෙදවුම් දක්වා විද්‍යාගාර සැලසුම් නිර්මාණය කර දක්වන්න. (ලකුණු 08)

(4) (i) විද්‍යාව විෂය නිර්දේශයේ 8 ශ්‍රේණියට අදාළ විෂය නිපුණතා දෙකක් ඉදිරිපත් කරන්න. (ලකුණු 02)

(ii) එම නිපුණතාවයන් අතුරින් එකකට අයත් නිපුණතා මට්ටම් දෙකක් දක්වන්න. (ලකුණු 04)

(iii) ඉහත කී එම නිපුණතා මට්ටම්වලට ළඟාවීමට සිසුයා තුළ සිදු කිරීමට අපේක්ෂිත වෙනස්කම් මොනවා ද? (ලකුණු 06)

(iv) නිපුණතා මට්ටමට ළඟාවීමේ දී සිසුයා තුළ අපේක්ෂිත වෙනස්කම් ජනිත වූ ආකාරය කෙටියෙන් දක්වන්න. (ලකුණු 08)

............

Sri Lanka Teachers Service - SLTS

## වාණිජ්‍යය (ව්‍යාපාර අධ්‍යයනය) (PE024E)

(1) (i) කන්නන්ගර යුගයේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට පෙර හා පසු වර්තමානය දක්වා වාණිජ අධ්‍යාපනයේ විකාශය සිදු වූ ආකාරය දක්වන්න. (ලකුණු 02)

(ii) ශ්‍රී ලංකාවේ මෙතෙක් සිදු වී ඇති ප්‍රධාන අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ වාණිජ විද්‍යා විෂයමාලාවට හිමි වූ තැන පැහැදිලි කරන්න. (ලකුණු 04)

(iii) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ ප්‍රගතිය වාණිජ විද්‍යා විෂයමාලාව කෙරෙහි බලපාන ආකාරය දක්වන්න. (ලකුණු 06)

(iv) වාණිජ විද්‍යා විෂයමාලාව වැඩ ලෝකයට අදාළ වන ආකාරය නිදසුන් ඇසුරින් විග්‍රහ කර දක්වන්න. (ලකුණු 08)

(2) (i) දැනට පාසල් පද්ධතියේ ක්‍රියාත්මක වන වාණිජ විද්‍යා විෂයමාලාවට අයත් විෂයයන් හා විෂය කොටස් පෙළ ගස්වන්න. (ලකුණු 02)

(ii) වාණිජ විද්‍යා විෂයධාරාවේ ප්‍රධාන අරමුණු පෙළ ගස්වන්න. (ලකුණු 04)

(iii) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විෂයමාලාවේ ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය විෂයමාලාව 10 සහ 11 ශ්‍රේණි වශයෙන් ද අ.පො.ස. (උසස් පෙළ) ගිණුම්කරණ විෂයමාලාව 12 සහ 13 වසර වශයෙන් ද වසර දෙක බැගින් උගන්වනු ලැබේ. පාසල් පද්ධතිය තුළ ක්‍රියාත්මක වන විෂයමාලාවේ ස්වභාවය ඉහත ප්‍රකාශය ඇසුරෙන් විග්‍රහ කරන්න. (ලකුණු 06)

(iv) වාණිජ විද්‍යා විෂය ධාරාවට අයත් විවිධ විෂයයන් ඉගෙනීම තුළින් පමණක් වැඩ ලෝකයට උචිත දරුවෙකු බිහි කළ හැකි ද? හේතු දක්වමින් විග්‍රහ කරන්න. (ලකුණු 08)

(3) (i) වාණිජ විද්‍යා විෂය ධාරාවට අයත් විෂය ඉගැන්වීමේ ක්‍රමශිල්ප තෝරා ගැනීමේ දී සලකා බැලිය යුතු කරුණු දක්වන්න. (ලකුණු 02)

(ii) වාණිජ ධාරාවේ විෂය ඉගැන්වීමේ ක්‍රම දෙකක් නම් කර ඒවායේ ඇති වාසි අවාසි පෙන්වා දෙන්න. (ලකුණු 04)

(iii) පන්ති කාමර කළමනාකරණය යන්න සරල ව දක්වා එහි දී සලකා බැලිය යුතු කරුණුවල ඇති වැදගත්කම විග්‍රහ කරන්න. (ලකුණු 06)

(iv) ඉගෙනුම් ඉගැන්වීම් ආධාර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට අත්‍යවශ්‍ය ද? හේතු දක්වමින් ඔබගේ මතය ඉදිරිපත් කරන්න. (ලකුණු 08)

(4) (i) තක්සේරුකරණය සහ ඇගයීම අතර වෙනස දක්වන්න. (ලකුණු 02)

(ii) ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ දී තක්සේරුකරණය සිදු කරන ආකාරය විස්තර කරන්න. (ලකුණු 04)

(iii) පාසල් පාදක තක්සේරුකරණයේ ඇති වැදගත්කම විග්‍රහ කර දක්වන්න. (ලකුණු 06)

(iv) ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තක්සේරු කිරීම සඳහා ගැළපෙන උපකරණයක් පිළියෙල කර පෙන්වන්න. (ලකුණු 08)

............

Sri Lanka Teachers Service - SLTS

## සිංහල භාෂාව (PE024F)

(1) (i) නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට අනුව පාසලේ 6-11 ශ්‍රේණිවල සිංහල භාෂාව හා සාහිත්‍ය විෂයයේ අරමුණු හතරක් ලියන්න. (ලකුණු 02)

(ii) පාසලේ වෙනත් සෑම විෂයයක් ම ඉගැන්වීමේ දී භාෂා විෂයය වැදගත් වන ආකාරය උදාහරණ මඟින් පෙන්වා දෙන්න. (ලකුණු 04)

(iii) පාසලේ විෂයමාලාව තුළ සිංහල භාෂාව හා සාහිත්‍යයට වැදගත් ස්ථානයක් හිමි වන බවට නිදසුන් සහිත ව සාධක හතරක් ඉදිරිපත් කරන්න. (ලකුණු 06)

(iv) "භාෂාව නිර්මාණශීලී පුද්ගලයන් බිහි කිරීමට ප්‍රබල දායකත්වයක් දෙයි" යන කියමන පිළිබඳ ව විනාඩි 05ක කථාවක් පාසලේ සිංහල භාෂා දිනයේ දී ඉදිරිපත් කිරීමට ඔබට පැවරී ඇත. එම කථාව ලියා දක්වන්න. (ලකුණු 08)

(2) (i) භාෂාව හා සාහිත්‍ය දැනුම වර්ධනය කර ගැනීමට යොදා ගත හැකි සන්නිවේදන මාධ්‍ය හතරක් ලියන්න. (ලකුණු 02)

(ii) භාෂාව හා සාහිත්‍ය භාවිතය මඟින් සංස්කෘතික හා සාරධර්ම වර්ධනය කර ගත හැකි බවට උදාහරණ දෙක බැගින් ගෙන කරුණු සාකච්ඡා කරන්න. (ලකුණු 04)

(iii) එදිනෙදා විවිධ භාෂා කාර්යයන්වල යෙදීමට අවශ්‍ය භාෂා හුරුව ලබා ගත හැකි බව උදාහරණ දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iv) භාෂා හුරුව නිවැරදි ව ලබා ගැනීමෙන් ජීවිතය සාර්ථක කර ගත හැකිය යන තේමාව සඳහා 11 ශ්‍රේණියේ සිසුන්ට ඉදිරිපත් කරන කරුණු කුඩා අත්පත්‍රිකාවක් ලෙසින් සකස් කරන්න. (ලකුණු 08)

(3) (i) සිංහල භාෂාව හා සාහිත්‍ය විෂයයට අදාළ ව 9-11 ශ්‍රේණිය සඳහා නිපුණතා හතරක් නම් කරන්න. (ලකුණු 02)

(ii) ඔබ ලියූ නිපුණතා හතරෙන් එක් නිපුණතාවක් සඳහා නිපුණතා මට්ටම් ලියා එහි විෂය අන්තර්ගතය සාකච්ඡා කරන්න. (ලකුණු 04)

(iii) ඉන් එක් නිපුණතා මට්ටමක් සාධනය කර ගැනීමට 9-11 ශ්‍රේණි අතුරින් ඔබ කැමති ශ්‍රේණියකට පාඩම් සැලැස්මක් පියවර වශයෙන් ලියා දක්වන්න. (ලකුණු 06)

(iv) පාසලේ 9-11 ශ්‍රේණිය දක්වා එකී නිපුණතා මට්ටමක් වර්ධනය වන ආකාරය උදාහරණයක් මඟින් සාකච්ඡා කරන්න. (ලකුණු 08)

(4) (i) සිංහල භාෂාව හා සාහිත්‍යය විෂයය ඇගයීම සඳහා සුදුසු ක්‍රමශිල්ප හතරක් ලියන්න. (ලකුණු 02)

(ii) තක්සේරුකරණය හා ඇගයීම ක්‍රියාවලිය අතර වෙනස සාකච්ඡා කරන්න. (ලකුණු 04)

(iii) ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ඇගයීම් උපකරණ භාවිත කිරීමේ ප්‍රයෝජන ලැයිස්තුගත කරන්න. (ලකුණු 06)

(iv) 6-11 ශ්‍රේණි අතුරින් ඔබ කැමති ශ්‍රේණියක සාහිත්‍ය පාඩමක් තෝරා ගෙන එම පාඩම ඇගයීම සඳහා නිර්ණායක සහිත ඇගයුම් උපකරණයක් සැලසුම් කරන්න. (ලකුණු 08)

Sri Lanka Teachers Service - SLTS

............

## බුද්ධ ධර්මය (PE024H)

(1) (i) "බුද්ධ ධර්මය" විෂයය යනු කුමක් දැයි කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 02)

(ii) බුද්ධ ධර්මය විෂයයෙහි විකාශය සිදු වූ අයුරු කරුණු හතරක් ඔස්සේ පැහැදිලි කර දක්වන්න. (ලකුණු 04)

(iii) බුද්ධ ධර්මය විෂයයෙහි අරමුණු හතරක් දක්වා, ඉන් එක් කරුණක් ප්‍රායෝගික ජීවිතයට අදාළ වන අයුරින් හඳුන්වා දෙන්න. (ලකුණු 06)

(iv) සිසු දරුවන්ගේ දිවිය යහමගට යොමු කිරීම උදෙසා බුද්ධ ධර්මය විෂයය උගන්වන ගුරුවරයෙකු ලෙස ඔබ විෂය කරුණු ක්‍රියාත්මක කරන්නේ කෙසේ දැයි විමසීමක යෙදෙන්න. (ලකුණු 08)

(2) (i) නිපුණතාවක් යනු කුමක් ද? පැහැදිලි කරන්න. (ලකුණු 02)

(ii) නිපුණතා පාදක ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ දී බුද්ධ ධර්මය විෂයය භාර ගුරුවරයා ලෙස ඔබගේ කාර්ය භාරය හඳුන්වන්න. (ලකුණු 04)

(iii) තෝරා ගත් ශ්‍රේණියක බුද්ධ ධර්මයෙහි මූලික ඉගැන්වීම් තේමාව සඳහා සුදුසු ක්‍රියාකාරකම් සැලසුමක් නිර්මාණය කර දක්වන්න. (ලකුණු 06)

(iv) සම්පත්දායකයෙකු ලෙස ක්‍රියා කිරීමට බුද්ධ ධර්මය විෂයය භාර ගුරුවරයා ලෙස ඔබ තුළ වර්ධනය කර ගත යුතු ගුණාංග මොනවා දැයි කරුණු හතරක් ඔස්සේ විමසන්න. (ලකුණු 08)

(3) (i) 7 ශ්‍රේණියේ බුද්ධ ධර්මය විෂයයට අදාළව නිපුණතා හතරක් ලියා දක්වන්න. (ලකුණු 02)

(ii) පැරණි බෞද්ධ අධ්‍යාපනයේ ඉගැන්වීම් ක්‍රමවේද හතරක් ලියා දක්වා, එවා පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 04)

(iii) ශාසන ඉතිහාසය ඉගැන්වීමෙන් සිසුන් තුළ වර්ධනය වන ගුණාංග පහක් දක්වා, ඒ සඳහා ඔබ ක්‍රියාකාරී වන අයුරු පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iv) බෝසත් චරිත 10-11 ශ්‍රේණි සිසුන්ට ඉගැන්වීම තුළින් ඔවුන්ගේ පෞරුෂ සංවර්ධනය සිදුවන අයුරු විස්තර කර දක්වන්න. (ලකුණු 08)

(4) (i) ගුණාත්මක යෙදවුම් භාවිත කිරීමෙන් ඔබට ලැබෙන ප්‍රයෝජන හතරක් දක්වන්න. (ලකුණු 02)

(ii) බුද්ධ ධර්මය විෂයයට අදාළ ව ගුණාත්මක යෙදවුම් නිර්මාණය කිරීමේ දී සැලකිය යුතු කරුණු මොනවා ද? (ලකුණු 04)

(iii) බුද්ධ ධර්මය විෂය භාර ගුරුවරයා ලෙස පාසල තුළ "විෂය සංවර්ධනය" උදෙසා ඔබ ගනු ලබන ක්‍රියාමාර්ගයන් පිළිබඳ විමසීමක යෙදෙන්න. (ලකුණු 06)

(iv) පාසල් පාදක ඇගයීමක් ලෙස බෞද්ධ කලා ශිල්ප නිර්මාණ තේමාව ඇගයීම සඳහා සුදුසු ඇගයීම් සැලසුමක් නිර්මාණය කරන්න. (ලකුණු 08)

************

## කිතුනු දහම (PE024 K)

(1) (i) ගව ලෙන, නත්තල් ගස, නත්තල් සීයා යන සංකල්ප කෙටියෙන් සඳහන් කරන්න. (ලකුණු 06)

(ii) වර්තමානයේ වාණිජත්වයට නතුව ඇති නත්තල් සීයා යන සංකල්පය ඉන් මුදවා, ගම්‍ය සැබෑ වටිනාකම් සිසුන් තුළ ආකල්ප වශයෙන් මතු කිරීම සඳහා නත්තල් සමයේ පන්ති කාමරය තුළ කළ හැකි ක්‍රියාකාරකම් උදාහරණ සහිත ව ලියන්න. (ලකුණු 14)

(2) පුරාණ ගිවිසුමේ සඳහන් "දතට දත", "ඇසට ඇස" යන මතයන් වෙනස් කිරීමට ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ කරන ලද පරිත්‍යාග හෙවත් "කුරුසයේ යාගයේ" වැදගත්කම් පහත මාතෘකා යටතේ පැහැදිලි කරන්න.

(i) පාසල් දරුවන්ගේ අන්‍යෝන්‍ය සුහදත්වය වර්ධනය කිරීම (ලකුණු 10)

(ii) සිසුන්ගේ අයහපත් චර්යා සංස්කරණය (ලකුණු 10)

(3) (i) පහසුකාරකයෙකු ලෙස
මාර්ගෝපදේශකයෙකු ලෙස
කළමනාකරුවෙකු ලෙස
පර්යේෂකයෙකු ලෙස
යන ගුරු භූමිකාවන්හි නිරත වීමේ දී ක්‍රිස්තු ධර්මය යොදාගත හැකි ආකාරය උදාහරණ මඟින් පැහැදිලි කරන්න. (ලකුණු 05 x 4)

(4) (i) ක්‍රිස්තු ධර්මය විෂය සාර්ථක ව ඉගැන්වීම සඳහා ජේසුස් වහන්සේ උපයෝගී කර ගත් අවස්ථා දෙකක් බයිබලය ඇසුරෙන් සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) එහි දී ජේසුස් වහන්සේ භාවිත කළ ඉගෙනුම් ක්‍රම ශිල්පයක් තෝරා විස්තර කරන්න. (ලකුණු 09)

(iii) විෂයට අදාළ ව ඉගෙනුම් ආධාරක සැකසීමේ දී සැලකිය යුතු කරුණු කිතු දහමේ අන්තර්ගත ප්‍රධාන සංකල්ප ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 09)

***********

Sri Lanka Teachers Service

## චිත්‍ර කලාව (PE024M)

(1) (i) සෞන්දර්ය විෂයයන් වශයෙන් චිත්‍රකලාව වැදගත් වන්නේ ඇයිදැයි ඔබේ අදහස එක් වැකියකින් දක්වන්න. (ලකුණු 02)

(ii) ඔබ හඳුනා ගත් පරිදි චිත්‍රකලාවෙන් සිසුයා තුළ සංවර්ධනය කළ හැකි පෞරුෂමය වෙනස්කම් හතරක් දක්වන්න. (ලකුණු 04)

(iii) ඔබ සඳහන් කළ පෞරුෂමය වෙනස්කම්වලින් අනාගත අභියෝගවලට මුහුණ දිය හැකි සිසුයෙක් බිහිවන්නේ ද පිළිබඳ විග්‍රහයක් කරන්න. (ලකුණු 06)

(iv) චිත්‍ර විෂයය පෝෂණය වන විෂයානුබද්ධ ප්‍රායෝගික කුසලතා සම්පන්න වීමේ දී ව්‍යවහාරික ජීවිතය හා බැඳී නිෂ්පාදන සේවා අවශ්‍යතා සඳහා යොමු වීමේ ප්‍රවණතාවක් ලෙස භාවිත කළ හැක්කේ කෙසේ දැයි පැහැදිලි කරන්න. (ලකුණු 08)

(2) (i) චිත්‍රකලා විෂයයෙහි අරමුණක් පැහැදිලි කරන්න. (ලකුණු 02)

(ii) විෂය නිර්දේශයට අදාළ ව චිත්‍රයක් සංරචනය කිරීමට සිසුයාට අවස්ථාව ලබා දීමෙන් ළඟාවීමට අපේක්ෂිත අරමුණ කුමක් ද? (ලකුණු 04)

(iii) එම අරමුණු ළඟා කර ගැනීමට පංතිකාමරයේ දී ඔබට භාවිත කළ හැකි ඉගෙනුම් ක්‍රමවේදයක් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iv) ඔබ සඳහන් කළ අරමුණු ඉටු කර ගැනීමට සුදුසු තේමාවක් තෝරා ගෙන ඒ ඇසුරින් එම අරමුණ සාක්ෂාත් කර ගන්නා ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 08)

(3) (i) චිත්‍ර විෂයයෙහි දී සිසුයා තක්සේරු හා ඇගයීම සඳහා භාවිත කළ හැකි ක්‍රම දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) E5 ආකෘතියට අනුව ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සිදු වන්නේ නම් එහි කුමන අවස්ථාවන්හි දී තක්සේරුව හා ඇගයීම සිදුවන්නේ ද? (ලකුණු 04)

(iii) තක්සේරුකරණයේ හා ඇගයීමේ ඇති වෙනස්කම් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iv) "ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ දී තක්සේරුව හා ඇගයීම සිදු විය යුතු ය." පක්ෂ ව හෝ විපක්ෂ ව අදහස් දක්වන්න. (ලකුණු 08)

(4) (i) මනෝවිද්‍යාත්මක හා සමාජවිද්‍යාත්මක ප්‍රවේශ ඔස්සේ ඔබ පංතිකාමරයේ හඳුනා ගත හැකි සිසු විවිධතා දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) ඔබ සඳහන් කළ විවිධතා සහිත දරුවන් හා ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සිදු කිරීමේ දී භාවිත කළ හැකි ඉගැන්වීමේ ක්‍රමවේද හතරක් දක්වන්න. (ලකුණු 04)

(iii) චිත්‍ර විෂයය ඉගැන්වීමේ දී එක් එක් සිසුයාගේ විවිධතා හඳුනා ගෙන සිටීම වැදගත් වන්නේ යැයි ඔබ සිතන්නේ ද? අදහස් දක්වන්න. (ලකුණු 06)

(iv) ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ දී ඔබට හමු වූ විවිධතා සහිත සිසුන්ගෙන් ඔබ කැමති විවිධත්වයක් තෝරා ගෙන මනෝවිද්‍යාත්මක හා සමාජවිද්‍යාත්මක ප්‍රවේශ ඔස්සේ එම විවිධත්වය ජය ගනිමින් පාඨමය අරමුණු සාක්ෂාත් කර ගන්නා ආකාරය විස්තර කරන්න. (ලකුණු 08)

••••••••••••

Sri Lanka Teachers Service - SETS

## නර්තනය (PE024N)

(1) නර්තන විෂය හා බැඳි නූතන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පන්ති කාමරයට පමණක් සීමා කළ නොහැකි හෙයින් නර්තන ගුරු භූමිකාවේ කාර්යභාරය වඩාත් පුළුල් වී ඇත.

(i) 1980 දශකයේ අධ්‍යාපන ක්ෂේත්‍ර සංවර්ධනයේ දී නර්තන විෂය විකාශය හා බැඳි සුවිශේෂ කරුණු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) 10 ශ්‍රේණියේ නර්තන විෂය හා බැඳි එක් ක්‍රියාකාරකමක් සැලසුම් කිරීමේ දී භාවිත කළ හැකි ගුණාත්මක සෙවුම් වර්ගයක් නම් කර එය භාවිතයේ ඇති වැදගත්කම සනාථ කරන්න. (ලකුණු 04)

(iii) 6 - 11 ශ්‍රේණි නර්තන විෂය නිර්දේශයන්හි අන්තර්ගතය සම්පාදනය වීමට මූලික වී ඇති අරමුණු ජීවිතය අර්ථවත් කර ගැනීමට වැදගත් වන්නේ කෙසේ ද? ඔබේ අදහස් දක්වන්න. (ලකුණු 06)

(iv) පෙර දිනයක දී ඔබ විසින් දෙන ලද ගැමි නැටුම් නිර්මාණ පැවරුම් පත්‍රිකාවට අනුව ක්‍රියාකාරකමක නියැලී සිටින සිසු කණ්ඩායම් 04 තක්සේරු කර ඇගයීමට ලක් කරන්න. ඔබ කළ තක්සේරුව හා ඇගයීම අතර ඇති ප්‍රවේශතා පිළිබඳ සංසන්දනාත්මක විග්‍රහයක් කරන්න. (ලකුණු 08)

(2) වර්තමානයේ පාසල් පද්ධතිය තුළ ක්‍රියාත්මක වන නර්තන අධ්‍යාපනය තුළින් ලබන අත්දැකීම් ජීවිතය අර්ථවත් කර ගැනීමට ඉවහල් වේ.

(i) පාසල් පද්ධතිය තුළ ක්‍රියාත්මක වන 6 වන ශ්‍රේණියට නිර්දේශිත නර්තන ක්‍රියාකාරකම් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) නර්තන විෂය හා බැඳි ප්‍රායෝගික ක්‍රියාකාරකමක් තෝරා ගෙන එය ඇගයීම සඳහා සුදුසු නිර්ණායක හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) නර්තන විෂය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී නිෂ්ක්‍රියතාවයෙන් මිදුණු සිසු සහභාගිත්වය සඳහා ගුණාත්මක සෙවුම් භාවිතයේ වැදගත්කම නිදසුන් දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iv) නර්තන අධ්‍යාපනය තුළින් ලැබෙන කායික, මානසික සමායෝජනය පෞරුෂ වර්ධනය කෙරෙහි බලපාන ආකාරය ඇගයීමට ලක් කරන්න. (ලකුණු 06)

(3) සිසු ඉගෙනුම් ප්‍රවර්ධනය සඳහා නර්තන විෂය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී විවිධ ඉගැන්වීම් ක්‍රම හා ඇගයීම් ක්‍රම භාවිත කිරීම වඩාත් සුදුසු ය.

(i) නර්තන විෂය ඉගැන්වීම සඳහා භාවිත කළ හැකි ඉගැන්වීම් ක්‍රම 04 ක් නම් කරන්න. (ලකුණු 02)

(ii) සිසු ඉගෙනුම් ප්‍රවර්ධනය සඳහා තක්සේරුව බලපාන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(iii) E5 සංකල්පය හා නර්තන විෂයේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය අතර ඇත්තේ මනා සබඳතාවකි. විචාරයට ලක් කරන්න. (ලකුණු 06)

(iv) නිපුණතාපාදක ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී නිර්මාණ ඉගෙනුම න්‍යාය නර්තන විෂයට වැදගත් වන්නේ කෙසේ දැයි හේතු දක්වමින් සනාථ කරන්න. (ලකුණු 08)

(4) නර්තන විෂය හා බැඳි අරමුණු පාසලේ සමස්ත විෂයමාලාව හා බැඳි ක්‍රියාකාරකම් තුළ වැදගත් මෙහෙවරක් ඉටු කරයි.

(i) නර්තන විෂය හා බැඳි එක් අරමුණක් කෙටියෙන් දක්වන්න. (ලකුණු 02)

(ii) 6-11 ශ්‍රේණියන්හි දී නර්තන විෂය හැදෑරූ සිසුනතු තුළ තිබිය යුතු චර්යාවන් දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(iii) පාසල තුළ ක්‍රියාත්මක වන ආගමික හා සමාජීය උත්සවවල දී නර්තන විෂය වැදගත් වන්නේ කෙසේ ද? කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06)

(iv) සිසු ගුරු භූමිකා සංවර්ධනය සඳහා විෂය සමගාමී ක්‍රියාකාරකම් හි සිසුන් නිරත කරවීමේ හා නිරත වීමේ ඇති වැදගත්කම පිළිබඳ කරුණු සංසන්දනය කරන්න. (ලකුණු 08)

............

## සංගීතය (PE024P)

(1) (i) සිසු පෞරුෂ සංවර්ධනය සඳහා පාසල් සංගීත විෂයමාලාවෙන් ඉටුවන්නා වූ කාර්ය භාරයන් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) එම කාර්ය භාරය ඉටු කර ගැනීමෙහි ලා සංගීත ගුරුවරයා සාර්ථක මාර්ගෝපදේශකයෙකු හා උපදේශකයෙකු වන්නේ කෙසේ දැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(iii) "සංගීත විෂයය සුසාධ්‍ය පෞරුෂ වර්ධනයක් ගොඩ නැගීමෙහි ලා උපකාරී වන විෂයයකි." මෙම කියමන හා ඔබේ අදහස් දක්වන්න. (ලකුණු 06)

(iv) සංගීත විෂයමාලාවෙන් මනා කොට පෝෂිත සිසුවා සමාජගතවීමෙන් පසු යහපත් ව්‍යවහාරික ජීවිතයකට යොමු වන්නේ කෙසේ දැයි විමර්ශනය කරන්න. (ලකුණු 08)

(2) (i) සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමා විසින් ආරම්භ කොට තිබූ මතුගම මධ්‍ය මහා විද්‍යාලයට පත් වූ ප්‍රථම සංගීත ගුරුවරයා කවුද? එම පත්වීම ලැබුවේ කිනම් වර්ෂයේ ද? (ලකුණු 02)

(ii) සංගීත ගුරුවරුන් ලෙස පුහුණු කිරීමේ ආයතන ඇතිවීම පාසල් සංගීත අධ්‍යාපනයේ ප්‍රගමනයට බලපෑ ආකාරය විස්තර කරන්න. (ලකුණු 04)

(iii) ජාතික අධ්‍යාපන ආයතනයේ සෞන්දර්ය දෙපාර්තමේන්තුවෙන් සංගීත විෂයයට සිදුවන මෙහෙය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iv) 1952 වර්ෂයේ ආරම්භ වූ රජයේ නැටුම් සංගීත විද්‍යාලය ස්වාධීන විශ්වවිද්‍යාලයක් දක්වා වර්ධනය වීම ඔබ දකින්නේ කෙසේ ද? (ලකුණු 08)

(3) (i) සංගීත විෂයය ඉගැන්වීමේ අරමුණක් සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) විෂය අරමුණු සියල්ල සාක්ෂාත් කර ගැනීමෙන් විෂය ප්‍රවීණයෙකු බිහිවේ ද? ඔබේ අදහස් දක්වන්න. (ලකුණු 04)

(iii) ඔබ ඉහතින් දැක්වූ අරමුණ සංගීතාම්ර ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ යොදා ගන්නා ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iv) ඔබ ඉහත (i) හි සඳහන් කළ අරමුණ කරා යොමුවන ආකාරයට තෝරා ගත් පාඩමක දළ සැලැස්මක් ඉදිරිපත් කරන්න. (ලකුණු 08)

(4) (i) සංගීතයේ දී භාවිත වන ස්වර යනු කුමක් දැයි හඳුන්වන්න. (ලකුණු 02)

(ii) සංගීතාම්ර ඉගැන්වීමේ දී "ස්වර අභ්‍යාස" කිරීමෙන් කුමන නිපුණතාවයක් ඇති කර ගත හැකි ද? (ලකුණු 04)

(iii) ඉහත පාඩම ඉතා සරල වී හා පහසුවෙන් ඉගැන්වීම සඳහා ඔබ ගුරුවරයෙකු වශයෙන් කුමන ඉගෙනුම් ක්‍රමවේදය භාවිත කරන්නේ ද? (ලකුණු 06)

(iv) සිසුවා ස්වර අභ්‍යාස ඉගෙනීමෙන් ඔහුගේ සංගීත ඉදිරි ගමනට කොතෙක් දුරට ඉවහල් වේ ද? විමසන්න. (ලකුණු 08)

............

Sri Lanka Teachers Service SLTS

## ජීවන නිපුණතා (PE024Q)

(1) (i) ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය බිහිවීමට සෘජුව බලපෑ හේතු දෙකක් දක්වන්න. (ලකුණු 02)

(ii) ජීවන නිපුණතා විෂයය "පුද්ගල පෞරුෂ සංවර්ධනයට" උපකාරවන අයුරු ජීවන නිපුණතා පාඩම් ඒකකයක් ආශ්‍රයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(iii) සිසුන් අතර පුද්ගල සම්බන්ධතා සංවර්ධනයට හේතුවන ආකාරය ජීවන නිපුණතා විෂය ක්ෂේත්‍රය ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 06)

(iv) යහපත් අන්තර් පුද්ගල සම්බන්ධතා පවත්වා ගැනීම ගුරු-සිසු දෙපිරිසට වැදගත් වන ආකාරය විවේචනාත්මක ව දක්වන්න. (ලකුණු 08)

(2) (i) 1956-2007 ජීවන නිපුණතා විෂයය විකාශනය වූ ආකාරය අනුපිළිවෙලින් දක්වන්න. (ලකුණු 02)

(ii) ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය 2007 දී හඳුන්වා දීමට බලපෑ හේතු දෙකක් ලියන්න. (ලකුණු 04)

(iii) 1972 වර්ෂයේ සමාජ අධ්‍යයන විෂයයත්, 2007 වර්ෂයේ පුරවැසි අධ්‍යාපනයත් හඳුන්වා දීමට බලපෑ සමාජ ආර්ථික පසුබිම විස්තර කරන්න. (ලකුණු 06)

(iv) පුරවැසි හා ජීවන නිපුණතා විෂයය හඳුන්වා දීමෙන් ගුරු-සිසු දෙපිරිසට බලපෑ වාසි අවාසි විවේචනාත්මක ව දක්වන්න. (ලකුණු 08)

(3) (i) ජීවන නිපුණතා විෂයයෙන් අපේක්ෂිත අරමුණු හතරක් නම් කරන්න. (ලකුණු 02)

(ii) ඔබ තෝරා ගත ජීවන නිපුණතා අරමුණක නිපුණතා සංවර්ධනයට ඔබ කරන ඉගෙනුම් මොනවා දැයි යෝජනා කරන්න. (ලකුණු 04)

(iii) යෝජිත ඉගෙනුම් ක්‍රමයක් පංතිකාමරයේ දියත් කරන ආකාරය කාර්ය පත්‍රිකාව ගුරු-සිසු ක්‍රියාකාරකම් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iv) ඔබ තෝරා ගත් ඉගෙනුමෙහි සාධාරණය කිරීමට හේතු පහක් දක්වන්න. (ලකුණු 08)

(4) (i) ජීවන නිපුණතා විෂයමාලාවේ සිරස් තිරස් සම්බන්ධතාව යනු කුමක් ද? (ලකුණු 02)

(ii) ජීවන නිපුණතා විෂයය ඉගැන්වීමේ දී ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේද තෝරා ගන්නා විට ගුරුවරයකු ලෙස සැලකිලිමත් විය යුතු කරුණු මොනවා ද? (ලකුණු 04)

(iii) ගුරු කේන්ද්‍රීය ඉගැන්වීමකට වඩා සිසු කේන්ද්‍රීය ඉගෙනුම් ක්‍රම පහක් දක්වා ජීවන නිපුණතා විෂයය ඉගැන්වීමට යොදා ගත හැකි අයුරු ඉගෙනුම් ක්‍රම දෙකක් ඇසුරින් පහදන්න. (ලකුණු 06)

(iv) ඔබ තෝරා ගත ඉගෙනුම් ක්‍රම දෙකෙන් ගුරු-සිසු දෙපිරිසට හිමි වන වාසි මොනවා දැයි වෙන වෙන ම ලියන්න. (ලකුණු 08)

............

Sri Lanka Teachers Service - SLTS

## Teaching English as a Second Language (PE024R)

1. i. **Name Four Approaches/ Methods** used in the teaching learning process of English as a Second Language (02 Marks)

   ii. Define two of these approaches briefly. (04 Marks)

   iii. Find out the similarities and differences of those two approaches. (06 Marks)

   iv. Discuss the importance of those two approaches to the present learning – teaching process of English as a Second Language. (08 Marks)

2. i. Name the **Eight** main areas come under the competencies relevant to English as a Second Language syllabus. (02 Marks)

   ii. Explain those areas briefly. (04 Marks)

   iii. What is the difference between competencies and competency levels? Explain with examples. (06 Marks)

   iv. Explain two teaching modes that can be used to help the students to achieve one of the competency levels. (08 Marks)

3. i. Name four Reading Skills. (02 Marks)

   ii. Define above four skills briefly. (04 Marks)

   iii. Explain (briefly) two techniques, which can be used to improve those Reading Skills. (06 Marks)

   iv. Prepare an activity to teach one of the Reading Skills and prepare a test item to assess the achievement level of that skill. (08 Marks)

4. i. Name four Speaking Skills. (02 Marks)

   ii. Define above four skills briefly. (04 Marks)

   iii. Explain (briefly) two techniques, which can be used to improve those Speaking Skills. (06 Marks)

   iv. Prepare an activity to teach one of the Speaking Skills and prepare a test item to assess the achievement level of that skill. (08 Marks)

********

Sri Lanka Teachers Service SLTS

## ඉතිහාසය (PE024S)

(1) (i) E5 ආකෘතියට අයත් පියවර පිළිවෙලින් නම් කරන්න. (ලකුණු 02)

(ii) එහි පළමු පියවර තුළ දී ඔබ විසින් පංතිකාමරය තුළ දී සිදු කරන කාර්යයන් දක්වන්න. (ලකුණු 04)

(iii) එම සංකල්පයට අනුව අවසාන පියවර සැලසුම් කරන ආකාරය තෝරා ගත් පාඩමකට අදාළ ව පහදන්න. (ලකුණු 06)

(iv) E5 ආකෘතියට අනුව තෝරා ගත් පාඩමක් සඳහා ක්‍රියාකාරකම් සැලැස්මක් සකස් කරන්න. (ලකුණු 08)

(2) (i) ඉගෙනුම්-ඉගැන්වීම් ආධාර යනු හඳුන්වන්න. (ලකුණු 02)

(ii) ඉතිහාසය විෂයය ඉගැන්වීමේ දී ඉගෙනුම් ආධාර යොදා ගැනීමේ ඇති වැදගත්කම දක්වන්න. (ලකුණු 04)

(iii) ඔබ විසින් නිර්මාණය කළ ඉතිහාසය විෂයයට අදාළ ඉගෙනුම්-ඉගැන්වීම් ආධාර දෙකක් නම් කර, ඒවා නිර්මාණයේ දී ඔබ සැලකිලිමත් වූ කරුණු පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iv) පංතිකාමරයේ දී පාඩමක් ඉදිරිපත් කිරීමේ දී ඉගෙනුම්-ඉගැන්වීම් ආධාර භාවිතය පිළිබඳ ව ඔබ කුමන කරුණු කෙරෙහි සැලකිලිමත් වන්නේ ද? (ලකුණු 08)

(3) (i) ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමශිල්පයක් ලෙස අනාවරණ ක්‍රමය යනු හඳුන්වන්න. (ලකුණු 02)

(ii) අනාවරණ ක්‍රමය යොදා ගැනීමේ ඇති වාසි හා අවාසි දෙක බැගින් ලියන්න. (ලකුණු 04)

(iii) සංකීර්ණ ඉතිහාසය විෂය කරුණු ඉගෙනුමට සිසුන් යොමු කිරීමේ දී අනාවරණ ක්‍රමයෙහි වැදගත්කම අදාළ විෂය කරුණු ඇසුරින් පහදන්න. (ලකුණු 06)

(iv) ක්‍රියාකාරකම් සැලැස්මෙහි දී පළමු හා දෙවන පියවරවල් අනාවරණ ක්‍රමය අනුව සැලසුම් කරන ආකාරය තෝරා ගත් පාඩමක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 08)

(4) (i) නිපුණතාවක් යන්නෙහි අදහස ලියා දක්වන්න. (ලකුණු 02)

(ii) ඉතිහාසය විෂයයෙහි විෂය නිපුණතා හතරක් දක්වන්න. (ලකුණු 04)

(iii) ඔබ විසින් උගන්වනු ලබන එක් ශ්‍රේණියකට අදාළ ව නිපුණතා මට්ටම හා විෂය අන්තර්ගතය නිදසුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iv) ඔබ ඉහත දැක්වූ නිපුණතා මට්ටමට ගැළපෙන ක්‍රියාකාරකම් සැලැස්මක් පියවර සහිත ව කෙටියෙන් දක්වන්න. (ලකුණු 08)

********

Sri Lanka Teachers Service SLTS

## භූගෝල විද්‍යාව (PE024T)

(1) (i) 1925 සිට වර්තමානය තෙක් භූගෝල විද්‍යා විෂයය විෂයමාලාව තුළ විවිධ වෙනස්කම්වලට භාජනය විය. ඒ ඒ වර්ෂ සඳහන් කර ගනිමින් එය පැහැදිලි කරන්න. (ලකුණු 02)

(ii) ලෝකයේ පැවැත්මට සම්බන්ධ වැදගත් විෂයයක් වූ භූගෝල විද්‍යා විෂයය තර විෂයමාලාවෙන් ඉවත් කිරීම යෝග්‍ය නොවන බවත් තර විෂයමාලාවට ඇතුළත් කිරීමෙන් ඇති ප්‍රයෝජනයන් පිළිබඳ කාලීන ව වැදගත් වන ආකාරය විග්‍රහ කරන්න. (ලකුණු 04)

(iii) සමාජ අධ්‍යයන විෂයය ඉගෙනුම්-ඉගැන්වීම් කාර්යයේ දී භූගෝල විද්‍යාව පිළිබඳ සකල දැනුමක් නැති ගුරුවරයෙකු වශයෙන් ඔබ මුහුණ දුන් ගැටලු කවරේදැයි පෙන්වා දෙන්න. (ලකුණු 06)

(iv) විෂය උගන්වන ගුරුවරයෙකු වශයෙන් ඇගයීම් ක්‍රියාවලියේ දී සියලු සිසුන්ට සාධාරණත්වය ඉටු කිරීම සඳහා තක්සේරු සහ ඇගයීම් ක්‍රියාවලියක් ලෙස ඔබ අනුගමනය කරනු ලබන ඇගයීම් කරුණු පෙන්වා ඇගයීම් පත්‍රිකාවක් සකස් කරන්න. (ලකුණු 08)

(2) (i) "විද්‍යා විෂයයන්හි මෑණියෝ භූගෝල විද්‍යාව යි." ලෝකයේ පවතින භෞතික මානව ක්‍රියාකාරකම් ඇසුරින් විෂයයෙහි ඇති වැදගත්කම උක්ත කරුණට අදාළ ව අනුමත කරන්න. (ලකුණු 02)

(ii) කාලීන වශයෙන් බලමින් ලෝකයේ පවතින අභිධාවනකාරී දියුණුව ස්වාභාවික විනාශ බවට පත්වෙයි. මීට අදාළ තොරතුරු සොයාගැනීමට ඔබ සිසුන් යොමු කරන්නේ කෙසේ ද? (ලකුණු 04)

(iii) අප වටපිටාව ස්වාභාවික උපද්‍රව රැසකින් යුතු වී පවතියි. එම උපද්‍රවවලට මිනිසාගේ දායකත්වය කෙසේ දැයි සිසුන්ගෙන් පිළිතුරු ලබා ගන්නා ආකාරය වගුවක් මගින් සකසන්න. (ලකුණු 06)

(iv) ක්ෂේත්‍ර චාරිකාවක් සංවිධානය කොට අප වටපිටාවේ (පරිසරයේ) ස්වාභාවික පැවැත්ම හා එහි හානියන් පිළිබඳ අවබෝධයක් ලබා දෙන ආකාරය ඔබ සැලසුම් කරන්නේ කෙසේ දැයි සැලසුම් පත්‍රිකාවක් නිර්මාණය කරන්න. (ලකුණු 08)

(3) (i) "භෞතික හා මානුෂ භූ දර්ශන සංරක්ෂණය" අර්ථ දක්වන්න. (ලකුණු 02)

(ii) භෞතික භූ දර්ශනයේ අසමතුලිතතාවයට ස්වාභාවික උපද්‍රව බලපාන ආකාරය පිළිබඳ අවස්ථා විග්‍රහ කරන්න. (ලකුණු 04)

(iii) ස්වාභාවික උපද්‍රව බොහොමයක් සිදුවීමට මානව ක්‍රියාකාරකම් දායක වන්නේ ය. එවන් අවස්ථා හා සිදුවීම් ඇතුළත් සැලසුමක් නිර්මාණය කිරීමට සිසුන් යොමු කරන්නේ කෙසේ ද? (ලකුණු 06)

(iv) මෙම උපද්‍රව අවම කිරීමට ගෝලීය වශයෙන් ගත යුතු ක්‍රියාමාර්ග ඇතුළත් පත්‍රිකාවක් නිර්මාණය කරන්න. (ලකුණු 08)

(4) (i) භූගෝල විද්‍යා විෂයය ප්‍රායෝගික ක්‍රියාකාරකම් අධික විෂයයකි. අනුමත කරන්න. (ලකුණු 02)

(ii) රටේ/ ලෝකයේ භෞතික භූ දර්ශන මානව ක්‍රියාකාරකම් පිළිබඳ අවබෝධයක් ලබා ගනියි. ඊට අදාළ කරුණු පෙළ ගස්වන්න. (ලකුණු 04)

(iii) රටක සැලසුම් සඳහා භූගෝල විද්‍යාව හැදෑරීම යෝග්‍ය වේ. අනුමත කරන්න. (ලකුණු 06)

(iv) භූගෝල විද්‍යාව පිළිබඳ උසස් ශාස්ත්‍රීය දැනුමක් තිබීම රැකියාවක් ලැබීමට ප්‍රමාණවත් නො වේ. ඊට අදාළ කරුණු එකරැස් කරන්න. (ලකුණු 08)

********

Sri Lanka Teachers Service

## පූර්වළමා අධ්‍යාපනය (PE024U)

(1) අමල් - "මොකද මගේ කතුර ඇදුවෙ. ඇස් පේන්නේ නැද්ද?"
සිමල් - "ඇස් පොට්ට වෙලා නොවෙයි, තමුසෙ කතුර පාරෙ තියා ගන්නෙ ඇයි?"
අමල් - "උඹ මට ගහන්නද?"
සිමල් - "ගැහුවොත් වැදෙන්නෙ නැද්ද?"

(ගුරුවරිය පංතියට පිවිසෙන විට මේ දෙදෙනා අරගල කර ගනියි.)

(i) ගැටුමට පාදක වූ සිදුවීම විග්‍රහ කරන්න. (ලකුණු 02)

(ii) "ගැටුමක් යනු දෙදෙනෙකු අතර අනවබෝධය යි." ඔබ පූර්වළමා අධ්‍යාපනය පාඩමට මේ සිදුවීම සම්බන්ධ කරන ආකාරය දක්වන්න. (ලකුණු 04)

(iii) "ගැටුම කළමනාකරණය" අර්ථ දක්වා ගැටුම වළක්වා ගැනීමේ ක්‍රමෝපායයන් අනාවරණය කරන්න. (ලකුණු 06)

(iv) සහයෝගයෙන් "එකට ජීවත්වීම" සඳහා ජීවන නිපුණතා හා පූර්වළමා අධ්‍යාපනය විෂය භාර ගුරුවරයා වශයෙන් ඔබට කළ හැකි විවිධ ව්‍යාපෘති ඇත. "සාමය" වචනයක් යොදා ගනිමින් එක් ව්‍යාපෘතියක් ලුහුඬින් ඉදිරිපත් කරන්න. (ලකුණු 08)

(2) (i) "බහු සංස්කෘතික සමාජය" නිර්වචනය කරන්න. (ලකුණු 02)

(ii) බහු සංස්කෘතික සමාජ අධ්‍යයනය සඳහා පූර්වළමා අධ්‍යාපනය විෂයය පාදක කරගත් අවස්ථා ඇත. එබඳු නිපුණතා මට්ටම් හතරක් ලියන්න. (ලකුණු 04)

(iii) පාසල් ප්‍රතිපත්තිය සැකසීමේ දී පූර්වළමා අධ්‍යාපනය විෂය භාර ගුරුවරයා සතු භූමිකාව ඉදිරිපත් කිරීමට ඔබට හැකිය. බහු සංස්කෘතික ඇගයීමට සහ ජාතික ඒකාබද්ධතාවට සුදුසු ව්‍යාපෘතියක් නම් කර, අරමුණු සමඟින් ලියන්න. (ලකුණු 06)

(iv) "භේදවලින් විනිර්මුක්ත ජන සමාජයක්" සඳහා නව විෂයයක් වශයෙන් පූර්වළමා අධ්‍යාපනය විෂය අන්තර්ගතයෙන් මහා පිටිවහලක් ලැබේ. ඔබේ අත්දැකීම් අනුව විමසන්න. (ලකුණු 08)

(3) (i) "සාරධර්ම" නිර්වචනය කරන්න. (ලකුණු 02)

(ii) සාර්ථක ජීවිතයකට අවශ්‍ය සාරධර්ම ලැයිස්තුවක් දක්වන්න. (ලකුණු 04)

(iii) ගැබ්වුණු විෂයමාලාව සාරධර්ම ප්‍රගුණ කිරීමට ආධාර වේ. වර්තමාන විධිමත් විෂයමාලාවේ මේ සඳහා පූර්වළමා අධ්‍යාපනය විෂයයට අවස්ථාව ලබා දී ඇත. විෂය නිර්දේශය හා ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය ඇසුරෙන් ඔබ හඳුනා ගත් සාරධර්ම මොනවා ද? (ලකුණු 06)

(iv) "හොඳ වැඩ පොත" ඔබ විසින් දැනටමත් හඳුන්වා දී ඇත. මේ පිළිබඳ ඔබේ අදහස් ක්‍රියාත්මක කිරීමේ දී ඇතිවන ගැටලු සාකච්ඡා කරන්න. (ලකුණු 08)

(4) (i) පූර්වළමා අධ්‍යාපනය සහ ප්‍රජා පාලනය යටතේ අධ්‍යයනය කරන ප්‍රජා සේවා සහ පොදු ස්ථාන මොනවා ද? (ලකුණු 02)

(ii) මෙම ස්ථානයන් නිරීක්ෂණයට යාමේ දී කණ්ඩායම් ලෙස කණ්ඩායම් 04කට පැවරුම් හතරක් ලියන්න. (ලකුණු 04)

(iii) මෙම අධ්‍යයනය සාර්ථක කිරීම සඳහා හෝ පාඩම දීර්ඝ කිරීම සඳහා ඔබ යෝජනා කරනු ලබන කාර්යයන් මොනවා ද? .- (ලකුණු 06)

(iv) ගුරු කාර්ය භාරයේ දී මෙම විෂයය හදාරන සිසුන් තුළ ගර සද්භාව ගුරුමාර්ගෝපදේශ ඇසුරෙන් දක්වා, ගුරුවරයෙකු හැටියට ඔබ මෙම විෂය ඉගැන්වීමට ඇති ලැදියාව සංක්ෂිප්ත ව පැහැදිලි කරන්න. (ලකුණු 08)

*********

# තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (PE024V)

(1) තොරතුරු සොයා යාම, පාඩමට අවශ්‍ය මෘදුකාංග ඒ අවස්ථාවේ දී ම භාවිත කිරීම අඩු ශ්‍රමයකින් හා කාලයකින් අධ්‍යාපන උපකරණ සකසා ගැනීම වැනි බොහෝ පහසුකම් නිසා අධ්‍යාපනයට තොරතුරු තාක්ෂණය යොදා ගැනීම ඵලදායී ය.

(i) පාසලක් තුළ අධ්‍යාපනයට තොරතුරු තාක්ෂණය යොදා ගැනීමේ බාධා පවතී. එවැනි බාධා තුනක් විස්තර කරන්න.

(ii) ඉහත බාධාවන්ට මුහුණ දීමට රජයට/පාසලට/ගුරුවරයාට ගත හැකි ක්‍රියාමාර්ග මොනවා ද?

(iii) පාසල් සිසුවකු පරිගණකයක් භාවිත කිරීමේ දී ඔහුට එල්ල විය හැකි සෞඛ්‍ය ගැටලු 03 ක් සඳහන් කර ඒවායින් වැළකීමට ඔහුට ගත හැකි ක්‍රියාමාර්ග මොනවාදැ යි පැහැදිලි කරන්න.

(iv) අන්තර්ජාලය හරහා පාසල් සිසුවකුට මාර්ගගත (online) පරීක්ෂණයකට මුහුණ දීමට අවස්ථාව සැලසී ඇත. සාම්ප්‍රදායික පරීක්ෂණයකට වඩා මාර්ගගත පරීක්ෂණයකින් සිසුවාට සැලසෙන වාසි 03 ක් සඳහන් කර විස්තර කරන්න.

(2) 9 A පන්තියේ ලකුණු ලැයිස්තුව

| | A | B | C | D | E | F | G |
|---|---|---|---|---|---|---|---|
| 1 | විභාග අංකය | සිසුවාගේ නම | ගණිතය | විද්‍යාව | සිංහල | සිසුවාගේ ලකුණුවල එකතුව | සිසුවාගේ ලකුණුවල සාමාන්‍යය |
| 2 | 1121 | අයිරාංගී සිල්වා | 50 | 80 | 12 | | |
| 3 | 1123 | සිතුමි ඩයස් | 45 | 34 | 50 | | |
| 4 | 1126 | රිතුකි දිසානායක | 67 | 56 | 70 | | |
| 5 | 1128 | අමාලි පෙරේරා | 89 | 78 | 80 | | |
| 6 | 1129 | සාමිල් සොයිසා | 34 | 90 | 90 | | |
| 7 | 1130 | සාකෝ ජයවීර | 56 | 75 | 60 | | |
| 8 | | | | | | | |
| 9 | | | | | | | |
| 10 | | පන්ති එකතුව | | | | | |
| 11 | | පන්ති සාමාන්‍යය | | | | | |

ඉහත දක්වා ඇත්තේ (Spread Sheet) පැතුරුම්පත අනුරුවකි. B5 කෝෂයෙහි සඳහන් ව ඇත්තේ අමාලි පෙරේරාගේ නම යි.

(i) විද්‍යාව විෂයෙහි පන්ති එකතුව, අමාලි පෙරේරාගේ සාමාන්‍යය ලියා ඇති කෝෂවල ලිපින (address) සටහන් කරන්න.

(ii) සිසුන් එකතුව සඳහා F2 හි තිබිය යුතු සමීකරණය ලියන්න.

(iii) C10, C11 යන කෝෂවල සටහන් විය යුත්තේ පන්තියේ ගණිත ලකුණුවල එකතුව හා පන්තියේ ගණිත ලකුණුවල සාමාන්‍යයයි. මේ සඳහා සමීකරණ ලියන්න.

(iv) ලේඛනගත ලකුණු ලැයිස්තුවකට වඩා පැතුරුම්පතක වාසි තුනක් ලියන්න.

(v) ප්‍රදර්ශන මෘදුකාංගයක් (Presentation package) භාවිතයෙන් පාඩමක් වඩා හොඳින් ඉදිරිපත් කිරීමට හැකි ය. එවැනි මෘදුකාංගයකින් පාඩමක් ඉදිරිපත් කිරීමට අවශ්‍ය පින්තූර නොයෙක් මාර්ගවලින් ලබා ගත හැකි ය. එවැනි මාර්ග 04 ක් සඳහන් කරන්න.

*********